# වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

# ජනතා වතු සංවර්ධන මණ්ඩලය

# ඇබෑර්තු

## කළමනාකරු (නීති / ඉඩම්) තනතුර

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනය වෙනුවෙන් නෛතික කටයුතු සිදු කිරීම, අධීක්ෂණය හා පවත්වාගෙන යාම සහ ආයතනයේ සියලුම ඉඩම්වල අයිතිය, මායිම්, මිනින්දෝරු සැලසුම්වලට අනුකූලව පවත්වාගෙන යාමට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධිය සමග ඇටර්නි බලපත්‍රය ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**පොදු කොන්දේසි**

**සේවා ගණය** : "ජ්‍යෙෂ්ඨ කළමනාකාර"

**වැටුප් තලය** : MM 1-1 රු. (53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575) හා ජීවන වියදම් දීමනාව

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**පත්වීමේ ස්වභාවය** : ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

**වෙනත් සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිලධාරියෙකු තෝරාගනු ඇත. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2020.07.23 වන දින හෝ ඊට ප්‍රථම **සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජනතා වතු සංවර්ධන මණ්ඩලය.**